# 10 ශ්‍රේණිය

| සතිය | ශ්‍රේණිය | නිපුණතාව | පාඩම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | | බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 9 සීල සුගන්ධයම උතුම් වන්නේය. | • සීලය යන්න පැහැදිලි කර එහි ප්‍රභේද නම් කරයි.<br>• සීලයෙහි පිහිටා දැහැමි දිවි පෙවෙතක් ගත කළ හැකි බව පිළිගනියි.<br>• වරදින් මිදී යහපතෙහි යෙදේ.<br>• සිල්වත් ජීවිතයක් ගත කරයි. | විරමණය හා සමාදානය, හිරි ඔත්තප්ප, (ලෝක පාලක ධර්ම) අත්තූපනායික ධර්මය, ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය | 2 |
| 2 | | සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. | 12 අටලෝ දහම | • අටලෝ දහම ඉදිරියේ ඉවසීමෙන් හා ධෛර්යවන්ත ව කටයුතු කරන අයුරු පැහැදිලි කරයි.<br>• අකම්පිතව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• ඉවසා දරාගැනීමේ ශක්තිය වැඩිදියුණු කර ගනී.<br>• අභියෝග හමුවේ නොසැලී කටයුතු කරයි. | අටලෝදහම (ඉවසා දරා ගැනීමේ ශක්තිය) | 2 |
| 3 | | බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 17 හේතුව ඵලය වෙයි. ඵලය හේතුව වෙයි. | • හේතුඵල දහම සරල ව පැහැදිලි කරයි.<br>• දෛනික සිදුවීම් අතර හේතුඵල සබඳතාවක් ඇති බව පිළිගනියි.<br>• ඉබේ කිසිවක් හට නොගන්නා බව වටහා ගෙන කටයුතු කරයි. | හේතුඵල සිද්ධාන්තය පිළිබඳ සරල හැඳින්වීමක් | 2 |
| 4 | | ජීව අජීව පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | 18 සාමකාමී ජීවිතයක් ගත කරමු. | • සාමකාමී ජීවිතයක අගය පැහැදිලි කරයි.<br>• සියලු සතුන්ට ලොව ජීවත් වීමට ඇති අයිතිය පිළිගනියි.<br>• සාමකාමී ජීවිතයේ වැදගත්කමත්, ප්‍රචණ්ඩත්වයේ ඇති හානිකර බවත් සංසන්දනය කරයි.<br>• සැමට හිතකාමී ජීවිතයක් ගත කරයි'. | සත්ත්ව කරුණාව, දයාව, සහිත ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිතයක අගය | 2 |
| 5 | | ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 20 ගැටලු විසඳන සසුන් පිළිවෙත | • දෙවන හා තෙවන ධර්ම සංගායනාවල අන්තර්ගතය පැහැදිලි කරයි.<br>• බුදු සසුන රැක ගැනීමට සංගායනා ඉවහල් වූ බව පිළිගනියි.<br>• දෙවන හා තෙවන ධර්ම සංගායනා ඇසුරින් වැදගත් තොරතුරු වගුගත කරයි.<br>• සාකච්ඡා මඟින් ගැටලු විසඳා ගනියි.<br>• සසුන රැක ගැනීමට දායක වෙයි. | දෙවන හා තෙවන ධර්ම සංගායනා | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | | බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියාකරයි. | 22 ණය නොවී සතොසින ගෙවමු දිවිමග දැහැමින | • සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ණය නොවීමේ හා නිවැරදි දිවි පැවැත්මේ අගය පැහැදිලි කරයි.<br>• ණයගැති බවින් මිදී නිවැරදි ජීවිතයක් ගත කිරීම වැදගත් බව පිළිගනියි.<br>• ණය නොවී නිවැරදි ජීවිතයක් ගත කිරීමට ක්‍රමෝපායන් සැලසුම් කරයි.<br>• ධාර්මික දිවි පෙවෙතක් ගතකරයි. | ධනෝපායනය (අනණ සූත්‍රය)<br>(අනණ සුඛය හා අනවජ්ජ සුඛය) | 2 |
| 7 | | | 23 රාජා භවතු ධම්මිකෝ | • දසරාජ ධර්ම පැහැදිලි කරයි.<br>• දැහැමි නායකත්වයට දසරාජ ධර්ම ඉවහල් කර ගත හැකි බව පිළිගනියි.<br>• යහපත් නායකත්ව ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• නිවැරදි නායකත්වයට ගරු කරයි.<br>• නායකයකු ලෙස කටයුතු කරයි. | දසරාජ ධර්ම<br>(ප්‍රායෝගික භාවිතය) | 2 |
| 8 | | නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයෙහි ගමන් කරයි. | 24 නිවන් මගෙහි බීජය ශ්‍රද්ධාවයි | • ශ්‍රද්ධාව හා එහි ප්‍රභේද හඳුන්වා දෙයි.<br>• සැදැහැ සිතින් කටයුතු කිරීමෙන් සැනසීම ලැබෙන බව පිළිගනියි.<br>• ශ්‍රද්ධාව හා භක්තිය අතර ඇති වෙනස පැහැදිලි කරයි.<br>• සැදැහැ සිතින් අර්ථවත් ක්‍රියාවන්හි යෙදෙයි. | ශ්‍රද්ධාව හැඳින්වීම හා එහි ප්‍රභේද | 2 |
| 9 | 10 ශ්‍රේණිය | තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි. | 1 අභියෝග ජයගත් සිදුහත් බෝසතාණෝ | • සිදුහත් බෝසත් සිරිත හා බැඳුණු සුවිශේෂ සිදු වීම් පැහැදිලි කරයි.<br>• බෝසත් චරිතයෙන් ආදර්ශ ලබා ගත හැකි බව පිළිගනියි.<br>• බෝසත් චරිතාදර්ශ අනුව කටයුතු කරයි. | සිදුහත් බෝසත් උපත, ශිල්ප හැදෑරීම, සතර පෙර නිමිති දැකීම, මහබිනික්මන | 2 |
| 10 | | | 2 නමදිමු අගයමු මහ සඟරුවනා | • සංඝරත්නයෙන් සිදු වන සමාජ මෙහෙවර පැහැදිලි කරයි.<br>• සැදැහැ සිතින් විහාරස්ථානය ඇසුරු කරයි.<br>• ආගමික කටයුතුවල දී මූලිකත්වය ගෙන ක්‍රියා කරයි.<br>• භික්ෂූන් වහන්සේලාගේ පැවැත්මට දායක විය යුතු බව පිළිගනියි. | සමාජ නායකත්වය, ආගමික මෙහෙවර, (දානමය පිංකම්, පිරිත් පිංකම්, ධර්ම දේශනා, මංගල - අවමංගල අවස්ථාවන්හි සහභාගිත්වය) | |
| 11 | | ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කරගනී. | 4 කුසල් සිත් වැඩිදියුණු කරමු. | • සමථ භාවනාව යන්න විස්තර කරයි.<br>• සමථ භාවනාව වැඩීමෙන් සිත එකග කර ගත හැකි බව පිළිගනියි.<br>• නිවැරදි ඉරියව් පවත්වමින් සමථ භාවනාවක යෙදෙයි.<br>• මනා සිහියෙන් දෛනික කාර්යයන් හි යෙදෙයි. | සමථ භාවනාව හැඳින්වීම පුද්ගල චරිත, සතර ඉරියව්, පූර්ව කෘත්‍ය | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | | | 7 මහලු වියෙහි දුක් නොවන්න, තුරුණු දිවිය ගොඩනගන්න. | • අචරිත්වා බ්‍රහ්මචරියං සහ උට්ඨානවතෝ සතිමතෝ යන ධම්මපද ගාථාවල සරල අදහස පැහැදිලි කරයි.<br>• ධම්මපද ගාථාවලින් ජීවිතාදර්ශ ලබාගත හැකි බව පිළිගනී.<br>• නිසිකල නිසි වැඩෙහි යෙදෙයි.<br>• පුද්ගලාභිවෘද්ධිය සඳහා කටයුතු කරයි. | අචරිත්වා බ්‍රහ්මවිහරං යන ගාථා යුගලය සහ උට්ඨානවතෝ සතිමතෝ යන ධම්මපද ගාථා හා ඒවායේ තේරුම | 2 |
| 13 | | බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 9 සබඳතා රකින මිනිස් යුතුකම් | • සදිසාවෙන් දැක්වෙන සාරධර්ම පැහැදිලි කරයි.<br>• තම යුතුකම් ඉටුකිරීමට සැලකිලිමත් වෙයි.<br>• සදිසාවන්හි දැක්වෙන යුතුකම් "ඊ" සටහනකින් නිරූපණය කරයි.<br>• සමාජ සබඳතාවල දී සහකම්පනයෙන් කටයුතු කරයි.<br>• යහපත් සමාජ සබඳතා ගොඩනගා ගනියි. | සදිසා නමස්කාරය (සිගාලෝවාද සූත්‍රය) | 2 |
| 14 | | බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගතකරයි. | 12 කර්මය සහ එහි ප්‍රභේද හැඳිනගනිමු. | • කර්මය, කර්මයේ ප්‍රභේද හා එහි විපාක සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.<br>• කර්මය දෙලොව දීම විපාක දෙන බව පිළිගනයි.<br>• කර්මයේ ප්‍රභේද ගැලීම් සටහනකින් දක්වයි.<br>• කිසියම් ක්‍රියාවක් සිදු කිරීමේ දී හොඳ නරක පිළිබඳ සැලකිලිමත් වෙයි. | කර්මය, කර්මයේ ප්‍රභේද හා කර්ම විපාක | 2 |
| 15 | | | 13 ඇති තතු කියන තිලකුණු දහම | • ත්‍රිලක්ෂණ ධර්මතාව පැහැදිලි කරයි.<br>• ත්‍රිලක්ෂණය ලොව පවතින සියලු ධර්මතාවලට පොදු වූවක් බව පිළිගනියි.<br>• වෙනස්වීම හැඳින ඊට අනුගතව කටයුතු කරයි. | ත්‍රිලක්ෂණය. | |
| 16 | | බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 15 සිව්සස් හැඳින සැනසුම ලබමු | • පටිච්ච සමුප්පාද න්‍යාය දැක්වෙන මූල සූත්‍රයේ අදහස පැහැදිලි කරයි.<br>• සියලු ම දේ හේතුඵල සම්බන්ධතාවෙන් හටගන්නා බව පිළිගනියි.<br>• ගැටලු නිරාකරණයේ දී එහි හේතුඵල සම්බන්ධතාව සොයා බලයි.<br>• පොදු ගැටලු අධ්‍යයනය කොට අන් අයට නිවැරදි ව මග පෙන්වයි. | පටිච්චසමුප්පාද මූල සූත්‍රය '' ඉමස්මිං සති ඉදං හෝති'' පාඨය සහ '' යෙ ධම්මා හේතුප්පභවා'' ගාථා | 2 |
| 17 | | ජීව අජීවි පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | 16 බුදු සිරිතයි පරිසරයයි | • බුදු සිරිත හා සම්බන්ධ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා ගෙනහැර දක්වයි.<br>• ජීවී පැවැත්මට ස්වාභාවික පරිසරයෙන් ලැබෙන දායකත්වය අගය කරයි.<br>• තම පරිසරය ප්‍රසන්නව පවත්වා ගනියි.<br>• පරිසරය සංරක්ෂණයෙහි යෙදෙයි. | බුදු සිරිතේ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 18 | | ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 19 සසුන සුරැකි සංගායනා | • අලුවිහාර ධර්ම සංගායනාව හා කනිෂ්ක ධර්ම සංගායනාවේ වැදගත්කම විස්තර කරයි.<br>• සංගායනා ශාසන චිරස්ථිතියට හේතු වූ බව පිළිගනියි.<br>• අලුවිහාර හා කනිෂ්ක යන සංගායනා දෙකෙහි ප්‍රතිඵල ලැයිස්තු ගත කරයි. | මාතලේ අලුවිහාර සංගායනාව, කණිෂ්ක සංගායනාව | 2 |
| 19 | | | 20 හෙළ කලාවන් සුරකිමු. | • ශාසන ඉතිහාසයෙන් අපට උරුම වූ කලා නිර්මාණ මොනවාදැයි පැහැදිලි කරයි.<br>• කලා ශිල්ප සංරක්ෂණය කළ යුතු බව පෙන්වා දෙයි.<br>• ගෘහ නිර්මාණ, චිත්‍ර කැටයම්වලට අදාළ නිර්මාණ වෙන් වෙන් ව ලැයිස්තු ගත කරයි.<br>• අතීත උරුමයන් අගයමින් ආරක්ෂා කරයි.<br>• පෞරාණික ස්ථාන නැරඹීමේ දී ඒවායේ පෞරාණිකත්වයට හානි නොවන සේ කටයුතු කරයි. | ස්තූපය, ස්තූප වර්ග, ස්තූපයක කොටස්, චෛතියඝර, වාහල්කඩ, පියගැට පෙළ මුරගල, කොරවක්ගල, සඳකඩපහණ, බෝධිඝර අනුරාධපුර, පොළොන්නරු චිත්‍ර | 2 |
| 20 | | බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 22 රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • රාජ්‍ය පාලනයට උපයෝගි කරගත හැකි බෞද්ධ ප්‍රතිපත්ති විස්තර කරයි.<br>• ධාර්මිකත්වය පදනම් කොට බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සකස් වී ඇති බව පිළිගනියි.<br>• වගකීමෙන් හා වගවීමෙන් යුතු ව කටයුතු කරයි.<br>• නීති ගරුක ව ජීවත් වේ. | දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීම | 2 |